රහස්‍යයි
அந்தரங்கமானது

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

### අ.පො.ස. (උ.පෙළ) විභාගය 2010
### க.பொ.த.(உ.தர)ப் பரீட்சை 2010

විෂයය / பாடம் } ලංකා ඉතිහාසය I    විෂයය අංකය / பாட இலக்கம் } 25

### ලකුණු දීමේ පටිපාටිය - I කොටස
### புள்ளி வழங்கும் திட்டம் - I ஆம் பகுதி

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 2 | 31. | 4 |
| 02. | 5 | 12. | 4 | 22. | 1 | 32. | 2 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 5 |
| 04. | 4 | 14. | 1 | 24. | 4 | 34. | 3 |
| 05. | 1 | 15. | 1 | 25. | 1 | 35. | 5 |
| 06. | 1 | 16. | - | 26. | 5 | 36. | 2 |
| 07. | 5 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 08. | 4 | 18. | 5 | 28. | 2 | 38. | 3 |
| 09. | 4 | 19. | 3 | 29. | 1 | 39. | 5 |
| 10. | 1/2 | 20. | 5 | 30. | 5 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு 01 ලකුණු / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்த புள்ளிகள் 01 X 40 = 40

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගය -2010 අගෝස්තු

### ඉතිහාසය I (II කොටස)

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය : ඈත අතීතයේ සිට 1948 දක්වා**

**දහවැනි ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**

( ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත)

************************************************************

1. අනුරාධපුර සමයේ දේශපාලන ඉතිහාසය හැදෑරීමෙහි ලා මූලාශ්‍රයක් වශයෙන් සෙල්ලිපිවලට හිමිවන වැදගත්කම් ප්‍රමාණ කරන්න. (ලකුණු 14 යි)

2. " මහසෙන් රජු බොහෝ පින් ද බොහෝ පව් ද රැස් කළේය."
   - (i) මහසෙන් රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)
   - (ii) මහසෙන් රජු විසින් කරන ලද වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 01යි)
   - (iii) මහසෙන් රජු මහා විහාරයට විරුද්ධව ක්‍රියා කිරීමට තුඩුදුන් සාධක සැකෙවින් පරීක්ෂා කරන්න. (ලකුණු 04 යි)
   - (iv) මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් ඉහත මහාවංස ප්‍රකාශය විචාරාත්මකව විභාග කරන්න. (ලකුණු 08 යි) 7

3. " I විජයබාහු රජු පොළොන්නරු යුගයේ රාජ්‍ය කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි." පහත සඳහන් මාතෘකා ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.
   - (i) විදේශීය ආධිපත්‍යයෙන් රට මුද ගැනීම
   - (ii) ඔහුගේ ශාසනික කටයුතු (ලකුණු 14 යි)

4. රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩුදුන් ප්‍රධාන සාධක කවරේද? (ලකුණු 14 යි)

5. ආරම්භයේ සිට 1619 දක්වා යාපන රාජධානියේ දේශපාලන ඉතිහාසයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 14 යි)

6. පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය සාකච්ඡා කරන්න.
   (i) පරිපාලනය (ii) අධිකරණය (iii) අධ්‍යාපනය (ලකුණු 14 යි)

7. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේගෙන් බුද්ධ ශාසනයට සිදු වූ සේවාව පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

8. " 1817-1819 උඩරටියන් නැගී සිටීම, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහස් අරගලය විය." එම සටනට තුඩුදුන් සාධක මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

9. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   - (i) පොළොන්නරු සමයේ ගෘහනිර්මාණ ශිල්පය
   - (ii) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ
   - (iii) බ්‍රිතාන්‍යයන් යටතේ රාජකාරි ක්‍රමය
   - (iv) 1910 1931 දක්වා ව්‍යවස්ථාදායක සභාවේ පැවැති නියෝජන ක්‍රමය (එක් කොටසකට ලකුණු 07 බැගින්)

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කොට ඒවායින් ඕනෑම ස්ථාන දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

    (i) උරාතොට (ii) මධ්‍යම පළාත
    (iii) දැදුරු ඔය (iv) කලා ඔය
    (v) මල්වාන (vi) ත්‍රිකුණාමලය
    (vii) සිතුල්පව්ව (viii) දීඝවාපි

**1. අනුරාධපුර සමයේ දේශපාලන ඉතිහාසය හැදෑරීමෙහි ලා මූලාශ්‍රයක් වශයෙන් සෙල්ලිපිවලට හිමිවන වැදගත්කම පුමාණ කරන්න.** (ලකුණු 14 යි)

අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහිලා සෙල්ලිපිවලට හිමිවන වැදගත්කම, වංසකතා . අට්ඨකථා ඇතුළු අනෙකුත් මූලාශ්‍ර සමඟ සංසන්දනාත්මකව සාකච්ඡා කර තිබීම වැදගත්ය.

- සෙල්ලිපිවල අන්තර්ගත දේශපාලන තොරතුරු සමකාලීනවීම, වෙනස් කිරීම්වලට ලක්වීම අවමවීම හා නිරවද්‍යතාවයකින් යුක්ත බව සඳහන් කිරීම.

- මහාවංස ඇතුළු අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍ර අඛණ්ඩ දේශපාලන ඉතිහාසයක් ඉදිරිපත් කළ ද සෙල්ලිපි මගින් ඉදිරිපත් කරනු ලබන්නේ සංක්ෂිත වූ දේශපාලන කරුණුය. ඇතැම් විට පාලක පරපුරු දෙක-තුනක් පමණ ඉතිහාසයකි. නැතහොත් පාලනය හා සම්බන්ධ නිලධාරීන්ගේ නිලනාම හෝ ආදායම් මාර්ග කීපයක් වැනි කරුණු කීපයකට සීමාවේ.

- මහාවංසය ඇතුළු අනෙකුත් සාහිත්‍යයික මූලාශ්‍රයන්හි අන්තර්ගත තොරතුරු තහවුරු කිරීමෙහි ලා සෙල්ලිපිවලින් සුවිශේෂිත දායකත්වයක් ලැබේ.

  නිදසුන්- උත්තිය රජු, වළගම්බා, කුටකණ්ණ තිස්ස, භාතිකාභය, මහාදාඨික මහානාග, වසභ, ආමණ්ඩ අභය, ගජබාහු සිරිනාග සිවුවැනි මිහිඳු වැනි පාලකයන් හා ඔවුන්ගේ පරපුර ගැන කරුණු තහවුරුවීම, කතරගම දසභාතික පාලකයන් හඳුනාගත හැකිවීම, දසමහා යෝධයින්ගේ (නන්දිමිත්‍ර,වේළුසුමණ ඵුස්සදේව) හඳුනාගත හැකිවීම.

- සාහිත්‍ය මූලාශ්‍රවලින් අනාවරණය නොවන ක්‍රි.පූ.2 සියවසට පෙර පැවැති ප්‍රාදේශීය පාලන ඒකක රසක් ගැන සෙල්ලිපිවලින් තොරතුරු ලැබීම.

  නිදසුන්:-බඹරගල,ගෝණවත්ත,ඇඹිල්අමේ,නැවිටුකන්ද,පෙරියපුලියන්කුලම, කුසලාන් කන්ද, මොට්ටයකල්ලු හා සිතුල්පව්ව වැනි ලේඛන මීට නිදසුන්ය.

- ශ්‍රී ලංකාවේ රාජත්වයේ ආරම්භය සාහිත්‍ය මූලාශ්‍රවල ඉන්දිය මූලයකට සම්බන්ධ වුව ද අභිලේඛනගත මූලාශ්‍රවලට අනුව දේශීයව ඇතිව ඇති වූ ආයතනයක් බව

තහවුරු කිරීමට හා එහි පරිනාමීය විකාශනයක් ගැන හැදැරීමට සෙල්ලිපි සාක්ෂි ලැබීම.

නිදසුන් ගමණි, රජ හා මහරජ මපුරුමුබ වැනි විරුදවල භාවිතය

- පාලකයන් භාවිත කළ පාලක විරුද හා එම විරුද ඇසුරෙන් පාලකයාගේ බලය වර්ධනය වූයේ කෙසේද හා එහි පරිනාමීය ස්වභාවය හඳුනා ගැනීමට සෙල්ලිපිවලින් අවකාශය ලැබීම.

  නිදසුන්: ගමණි, රජ, මහරජ, දෙවනපිය, පිතමහරජ, අපය, අබය, මපරුමුක සිරිසඟබෝ, අබසලමෙවන්'

- සාහිත්‍ය මුලාශ්‍රවල සඳහන් නොවන පාලක සම්බන්ධතා සෙල්ලිපි මඟින් එළිදැක්වීම

  වසභ රජුගේ පුතුන්වන උතර (හැබැස්ස ලිපිය) දුටග (කම්මැන්නාකන්ද ලිද සිරිනාගගේ පුතෙකු ලෙසින් මෙකවනඅබය (ගෝඨාභය) දැක්වීම (තිඹිරිද ලිපිය)

- ඊට අමතරව රාජ්‍යය පාලනය හා සම්බන්ධ වූ නිලධාරිහු කවරහු ද යන්න සෙල්ලිපි මඟින් බොහෝ තොරතුරු අනාවරණයවීම.

  නිදසුන් :- උවරජ හෝ උපරජ සෙනපති, අමති, මහමති, බඩකරික,

රටික,රොහණ බොඣක, හා ගමික වැනි නිලධාරීන්

- ලක්දිවට පැමිණි ආක්‍රමණිකයින්ගේ නම් සෙල්ලිපි අනුසාරයෙන් හඳුනාගත හැකිවීම.

  නිදසුන්-බුදදස ලපරිදෙව (බුද්දපාරින්ද) රුවන්වැලිසෑය ලිපිය (සරතර ) තිරිතර, කතරගම සෙල්ලිපිය

- අභිලේඛන ස්ථානගතවීම හරහා පාලකයාගේ බලය ව්‍යාප්ත වූයේ කෙසේද ය හඳුනාගත හැකිවීම.

නිදසුන්:-වසභ රජුගේ වල්ලිපුරම් රන් තහඩු ලිපිය, කාසිමොට්ටෙයි, සඳගිරිවිහාර ලිපිය, ගජබාහු රජුගේ සිතුල්පව්ව හා ගොඩවාය ලිපි

- පාලනය හා සම්බන්ධ අධිකරණ කටයුතු ඉන් ලැබුණු අදායම් මාර්ගයක් ගැන තොරතුරු ගජබාහු රජුගේ සිතුල්පව්ව ලිපියෙන් අනාවරණයවීම.

2. " මහසේන රජු බොහෝ පින් ද බෝහෝ පව් ද රැස් කළේය."

(i) මහසෙන් රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)

ගෝඨාභය රජු

(ii) මහසෙන් රජු විසින් කරන ලද වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 01 යි) 2

මින්නේරි, මහාගල්ල, හුරුල්ල, ඛානු (කනදරා), මාමිණියා, කෝකවාත, මොරවාපි (මොර වැව),කිඹුල්වානාව,වාහ,රත්තමාලකන්ඩ,තිස්සවඩ්ඪමානක (රන්තිසා/කවුඩුල්ල) මහදාරගල්ල (මහගල්කඩවල), ඛිරවාපි, කාලපාසාණ (කලවාන). මෙයින් නම් දෙකක් ලබාදී ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iii) මහසෙන් රජු මහාවිහාරයට විරුද්ධව ක්‍රියා කිරීමට තුඩුදුන් සාධක සැකෙවින් පරික්ෂා කරන්න. (ලකුණු 04)

- සංඝමිත්ත භික්ෂුවගේ පෙළඹවීම හා සෝණ ඇමතිවරයාගේ සහාය.
- මහාවිහාරිකයන්ට එල්ල වූ අවිනයවාදී චෝදනා
- වෛතුල්‍යවාදී පාර්ශ්වය බලගතු වීම හා ඔවුන්ගේ සහාය ලැබීම

(IV) මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් ඉහත මහාවංස ප්‍රකාශය විචාරාත්මකව විභාග කරන්න. (ලකුණු 08 යි) 07

- මෙමගින් මහසෙන් රජු විසින් කරන ලද යහපත් සහ අයහපත් ක්‍රියා කවරේද යන්න විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

- පව්බතන්ත ඇල ඇතුළු ඉහත සඳහන් වාරි කටයුතු සංවර්ධනය කිරීම මඟි කෘෂිකර්මාන්තය නඟාලීමට කටයුතු කිරීම

- ජේතවන විහාරය, මින්නේරිය විහාරය, කොකවාත මහා විහාරය, රූපාරා විහාරය, චූලවිට්ටි විහාරය හා උත්තර සහ අභය යන භික්ෂුණී ආරාම දෙ කරවීම, කාලවේල යක්ෂයාගේ වාසස්ථානය පිහිටි ස්ථානයෙහි ස්තූපයක් කරා ඇතුළු දිවයින මුළුල්ලේම ජරාවාස වූ විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම.

- ප්‍රධාන භික්ෂූන් දහසකට දහසක් වටිනා වස්තු පූජා කිරීම, වසරක් පාසා චී පූජා කිරීම, අපරිමිත වූ ආහාරපාන දන්දීම. (සිව් පසයෙන් උපස්ථාන)

- ගෝකණ්ණ, ඒරකාපිල්ල හා කලන්දික බ්‍රාහ්මණ ග්‍රාමවල පැවති දේවාල තු විනාශ කොට විහාර තුනක් කරවීම.

- මහා විහාරවාසී භික්ෂූන්ට දන් දෙන්නන්ට සියයක් දඩ ගැසීමට අණදා තැබීම.

- මහා විහාරික භික්ෂූන්ට මහා විහාරය අතහැර යාමට සැලැස්වීම.

- මහාවිහාරයේ ගොඩනැගිලි විනාශ කිරීමට අනුමැතිය ලබාදීම.

- මහාවිහාර සීමාව උල්ලංඝණය කරමින් ජේතවන විහාරය කරවීම.

- මහාවිහාර භූමියේ ගොඩනැගූ ජේතවනාරාමය සාගලික නිකායික භික්ෂුවක කොහොන් තිස්ස තෙරුන්ට පූජා කිරීම.

3. <u>"I වන විජයබාහු රජු පොළොන්නරු යුගයේ රජ කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි" පහත සඳ මාතෘකා ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.</u> (ලකුණු 14 යි)

1 විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම හා රට එක්සෙසත් කිරීම

- මෙම කාර්‍ය පියවර දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය.

1 <u>රෝහණය එක්සත් කිරීම</u>

- I විජයබාහු රජු මුලින් පෙනී සිටින්නේ කීර්ති කුමරු ලෙසය. රාජ එක්සත් භාවය ඇතිකර ගැනීමට නොපසුබට උත්සාහයෙන් හා අසිරුවෙන් පළමුව පියවර ගැනීමට සිදු වේ.

- රුහුණේ තිබූ විවිධ දේශපාලන නායකත්වයන් නිසා රජු මුල් කට මුහුණ පෑ විවිධ දුෂ්කරතා හා ඒවා ජයගත් ආකාරය.

- ශ්‍රේෂ්ඨාතු කාශ්‍යප, ලෝකේශ්වර වැනි රුහුණේ පාලකයන් හා වැඩීමින් සිය බලය රුහුණේ තහවුරු කර ගැනීමට පියවර ගැනීම.

- 1055 දී 17 වියැති කීර්ති කුමරු රුහුණේ තොසජ්ජපුත්තා වැඩලමින් විජයබාහු නමින් කතරගම්දී රජකමට පත්විම.

<u>2 විදේශිය පාලකයන්ට එරෙහිව නැගී සිටීම</u>

- සොළින් යටතේ වීසූ රජරට වැසියා අයබදු නොගෙවීමෙන් විශාල කැරැල්ලක් ඇති කිරීම.
- එය මර්දනය කිරීමට පැමිණි ඉන්දිය සොළී හමුදාව කැරැල්ල ද මැඩ පවත්වා රුහුණ ද ආක්‍රමණය කිරීම.
- ඒ අතරේ රවිදේව හා චල යන සිංහල සෙන්පතිවරු සිය සේනාවන් සමගින් සොළින් හා එකතුවීම. (1066-67)
- 'පලටුපාන' (පලටුවගිරිය) ස්ථානයේදී ඇතිවන සිංහල - සොළී සටනින් I විජයබාහු රජු ජය ජය ගැනීම හා මහාවස්තුවක් ද සොළින්ගෙන් අත්පත් කර ගැනීමත් පොළොන්නරුව ද ජයග්‍රහණය කිරීමට ඒසමගම හැකිවීම.
- ක්‍රි. ව. 1063 - 69 අතරේදී වීරරාජේන්ද්‍ර නම් සොළී රජු නැවත සොළී හමුදාවක් සිය බලය තහවුරු කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවට එවීමත් එම සේනා අයින් විජයබාහු පරාජය වී වාතගිරියට පසුබැසීම.
- ඒ අතරේදී ජේතධාතු කාශ්‍යපගේ සොහොයුරෙකු ගුත්තසාලයේ දී කැරැල්ලක් ඇති කළේය.එය මැඩ පැවැත්වීමට සිදුවීම හා මහානාගකුලයේ සිට සිය හමුදාව විජයබාහු විසින් ශක්තිමත් කර ගැනීම.
- මෙම කාලයේදී වීරරාජේන්ද්‍ර සොළී රජුගේ අභාවය සිදුවීම නිසා සොළී රාජ්‍යයේ දේශපාලන තත්ත්වය ව්‍යාකූල වීම.
- මෙම තත්ත්වය ප්‍රයෝජනයට ගත් I විජයබාහු රජු පොළොන්නරුවේ සොළින්ට තුන් පැත්තකින් මාස 1 ½ ක් අතරේදී සොළින් පරාජය කළ හැකිවීම.
- පොළොන්නරුවට පහර දෙන අවස්ථාවේදී රවිදේව හා චල යන සෙන්පතිවරු නැවත සිංහල හමුදාවට එක්වීම.
- 1070 දී සොළී බලය වනසා I විජයබාහු විදේශ ආධිපත්‍යයෙන් ලංකාව නිදහස් කර ගැනීම.

- චෝළ ආධිපත්‍යයෙන් දිවයින මුදවාගෙන රට එක්සේසත් මෙතුමාගේ ශ්‍රේෂ්ඨත්වයට හේතු වුවත් අනතුරුව අනුගමනය කෑ කලාපය ද එම ශ්‍රේෂ්ඨත්වය තිව්‍ර කිරීමට බලපා ඇති බව.
- නායකත්වයට පත්වීමෙන් පසු නටබුන්ව පැවැති වාරි ප්‍රතිසංස්කරණය කිරීම
- සාහිත්‍ය පෝෂණය පිණිස කවීන්ට පඩුරු හා ගම්බිම් අසරණයන්ට සැලකීම සිවුපාවුනට ආරක්ෂාව සැලසීම

2 ශාසනික කටයුතු

- ඔහුගේ ශාසනික කටයුතු බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්ව උපසම්පදාව නැවත් ඇති කිරීම හා ලක් භික්ෂු ශාසනය නැවත සං කිරීම පිණිස බුරුම සහාය ලබා ගැනීම.
- අවශ්‍ය ත්‍රිපිටක පොත්පත් බුරුමයෙන් ගෙන්වීම ත්‍රිපිටක සම්පාදනයට අවශ්‍ය පහසුකම් සැලසීම.
- ත්‍රිපිටකය ලියවා පූජා කිරීම.
- මාලිගාවට උතුරු දෙසින් දළදා මැදුර ඉදිකිරීම හා වාර්ෂිකව දළද පැවැත්වීම.
- අගනුවර තුළ වෙහෙර විහාර කරවා තුන් නිකායට අයත් භික්ෂූ කරවීම.
- අනුරාධපුරයෙහි අෂ්ට මූලායතනයන් සඳහා පොළොන්නරුවේ මූ කරවීම (කපාරමූල. උත්තරමූල වැනි ආයතන)
- ජම්බුකොළ විහාරය. මැදිරිගිරිය. මහියංගනය. කසාගල්ල විහා දෙවිනුවර වේලගාම විහාරය ආදි බෞද්ධ ස්ථානවල ප්‍රතිසං කටයුතු කිරීම හා අනුරාධපුරයෙහි ශ්‍රී මහා බෝධි ප්‍රාකාරය ව කරවීම.
- විහාරාරාමවල නඩත්තුවට නැවත ගම් බිම් පවරාදීම. (තිස්සමහ සඳගිරි වෙහෙර හා දෙවිනුවර උරුවෙල විහාර ඉදිකිරීම) සිය දෙ වෙනුවෙන් බුද්ධලච්චිධියේ විශාල සංඝාරාම පහක් කිරීම.
- අන්තරවිට්ඨිය,සංඝාතගාමය,සිරිමණ්ඩලගාමය, ආදි ගම්වර වනවාසී නිකායික භික්ෂූන්ට පූජා කිරීම.

- ශ්‍රී පාදය වැඳපුදා ගැනීමට යන අයට පහසුකම් සලසාදීම (අම්බගමුව සෙල්ලිපියට අනුව ශ්‍රී පාදයේ තවත්තුවට ගිලීමලය පූජා කර ඇත.) ශ්‍රී පාද ලාංඡනය දැලකින් වැසූ බව හා ආරක්ෂාවට දොරටු සහිත මහපවුරක් කරවා ගම්බිම ද පූජා කිරීම.

**4. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීමට තුඩුදුන් ප්‍රධාන සාධක කවරේද?**

(ලකුණු 14) යි)

- රජරට ශිෂ්ටාචාරය යනු සියවස් පහළොවකට අධික කලක් අනුරාධපුර රාජධානිය හා පොළොන්නරු රාජධානි කාලය ආවරණය කෙරෙන. අවධි ලෙසින් දැන ගැනීම හා පරිහානිය සහ බිඳවැටීම යන වචන දෙක පැහැදිලිව හඳුනා ගෙන තිබීමත් වැදගත්ය.
- රජරට ශිෂ්ටාචාරය ක්‍රමයෙන් ජන ශූන්‍යවීමටත් පැරණි වෙහෙර විහාර දාගැබ් සහ වාරි මාර්ග අභාවයට යාමත් පරිපාලන කේන්ද්‍රය නිරිත දිගට විතැන්වීමත් ඉදිකිරීම හා සබැඳි තාක්ෂණයේ බිඳ වැටීමටත් බලපෑ සාධක හා කරුණු සම්බන්ධයෙන් ඉතිහාසඥයින් අතර නිශ්චිත එකඟතාවක් නොමැතිවීම හා මේ සම්බන්ධයෙන් මතවාද රැසක් ඇතිබව දැක්වීම.
- දේශගුණික විපර්යාසය රජරට සභ්‍යත්වය පිරිහීමට හේතුවක් ලෙසින් ආර්. එල් බ්‍රොහියර්.(R.L. Brohier) ඊ.කේ. කුක්.(E. K.Cook) ටී. ඩබ්ලිව්. ටිසල් ජෝන් (T.W.Tyssul Jones) දක්වති. නමුත් රෝඩ්ස් මර්ෆි ( Rhods Murphy) මේ අදහස ප්‍රතික්ෂේප කරයි.
- පස නිසරුවීම හා පසු සේදියාම නිසා ක්‍රමයෙන් වාරිමාර්ග ගොඩවීමත් රාජ රට සභ්‍යත්වයේ පිරිහීමට බලපාන්නට ඇතැයි ආර්.එච්. ස්පෙන්සර් ශ්‍රේඩර් (R.H. Spencer Shrader). එච්.අයි.එස්. තර්ලවේ (H.I.S. Thirlaway), පෙන්වා දෙති.
- මැලේරියා වසංගතය රජරට සභ්‍යත්වයේ පරිහානියට මුල් වූ බව ලූසියාස් නිකොල්ස් (Lucius Nichols), ජෝන් ස්ටිල් John Still), එස් වී. පියර්සන් (S.V. Person), ටී. ඩබ්ලිව්. ටිසල් ජෝන් (T.W.Tyssul Jones) , සහ මයිකල් රොබට්ස් (Michal Roberts) සඳහන් කරති.

- එච්.ඩබලිව්.කොඩ්රිංටන් (H. W. Codrington) එස්. පරණ Paranavitana) අමරදාස ලියනගමගේ (Amaradasa Liyanagama ඉන්ද්‍රපාල (K. Indrapala) ජෝන් සිටිල් (John Still),එස්. වී. පි Person) වැනි විද්වතුන් විසින් පෙන්වාදෙනුයේ විදේශ ආක්‍රම රජරට සභ්‍යත්වයේ පිරිහීමට බලපා තිබෙන බවය.
- පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ සංකේන්ද්‍රගත පාලනය හා පසු වැටීම, කාලිංග මාඝ විසින් කුලීනයන් විනාශ කිරීමේ ප්‍රති පරිපාලනය පිළිබඳ ඥාණයක් ඇතිව සිටි පිරිස් රජරටින් පලායා මත සමාජ රටාඑව් බිඳවාටීම මෙම පරිහානියට හේතු වූ බව දක්වයි.
- තෙත් කලාපයට ක්‍රමයෙන් සංක්‍රමණය වූ පිරිස් වියලි කලාපයට ආකර්ෂණය හේතුවෙන් ජනතාව එහිම පදිංචිවීම රජරට පරිහානියට හේතුවක් වූ බව මයිකල් රොබට්ස් සඳහන් කරයි.
- දහතුන්වැනි සියවසින් පසු ඉන්දිය සාගරයේ ඔස්සේ සිදු වූ වා වෙස්වීම් ද මේ කෙරෙහි බලපා තිබීම.
- පොළොන්නරු සමයේ නායකත්වය සහ පාලකයන් අ වංසාන්තර ගැටුම්, දුර්වල පාලකයින් බලයට පත්වීම, හා කා ආක්‍රමණය මෙන්ම ඔහුගේ ක්‍රියාකාරිත්වය ද පරිහානිය වේගව බිඳවැටීම ද සනිටුහන් කිරීම.
- රජරට සභ්‍යත්වයේ පරිහානියට මෙන්ම බිඳවැටීමට එකම හේ හේතුන් රැසක්ම මුල් වූ බව සඳහන් කොට තිබීම වැදගත්ය.

<u>05. ආරම්භයේ සිට ක්‍රි. ව. 1619 දක්වා යාපන රාජධානියේ දේශපාලන ඉති අවස්ථා ගෙනහැර දක්වන්න.</u> (ලකුණු 14)

- මූලාශ්‍ර:- යාපන රාජධානිය ගැන හැදෑරීමට කෛලාය මාලෙ, යාළ් මාලෙයි, ශෙගරාශශේකර මාලෙයි, නිකාය සංග්‍රහය, ඉබන් මාර්කෝපෝලෝගේ වාර්තා ප්‍රයෝජනවත්වන බව දැක්වීම

- පොළොන්නරුව බිඳවැටීමෙන් පසුව ~~ක්‍රි. ව. 1215 දී පමණ~~ යාපනය ස්වාධීන ප්‍රාදේශීය පාලන ඒකකයක් ලෙසින් ආරම්භ වීම.
- චන්ද්‍රභානු පරාජය කළ වීරපාංඩ්‍යගෙන් පසු යාපනය රාජධානියක් ලෙසින් ඉදිරියට ආවේය.චිංකෙයාරියර් හෙවත් ආර්‍ය චක්‍රවර්ති පරපුර යාපන රාජධානියේ බලය ලබා ගත්තේය.
- ආර්‍ය චක්‍රවර්තිනු බ්‍රාහ්මණ කුලයකට අයත් වූ අතර පාණ්ඩ්‍ය රාජධානියේ දක්ෂිණ ප්‍රදේශයක් වූ චෙව්විරුක්කයිනාටු නම් ප්‍රදේශයේ ප්‍රාදේශික අධිපතින්ගේ පවුලකට වූවෝ වෙති.
- ජෙයවීර චිංකෙයාරියර් යාපන රාජධානියේ මුල් පාලකයා වූ අතර සිය මාළිගය යාල්ප්පානම් හෙවත් යාපනයේ පිහිටුවාගනු ලැබීය.
- කුලශේකර ශිංගෙ විසින් රාජධානියේ පරිපාලන කටයුතු දියුණු කළේය. වරෝදය ශිංගෙ අරියන් සිංහල දෙමළ සමගියට කටයුතු කළ අතර මාර්තාණ්ඩ ශිංගෙ වන්නියාර්වරුන් ගේ නැගි සිටීම අවම කළේය මොහුගේ පාලන සමය යාපන රාජධානියේ සෞභාග්‍යවත් අවධියක් ලෙසත් යාපන රාජධානියේ වර්ධනයේ ඉහළ අවස්ථාවක් ලෙසත් මූලාශ්‍ර මඟින් පෙන්වා දෙති.
- ජයවීර ශිංගෙ මුතුපර පිළිබඳ අරාවුලක නිසා බුවනෙකබාහු රජු පරාජය කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් ඔහුගේ ධජය වසර දොළහක් පමණ දිවයිනේ ලෙලදුන් බව දැක්වේ. පරරාජශේකරන් රජු දවස ඔහුගේ සොයුරු ශේගරාජශේකරන් විසින් යාපනයේ දේමළ ශාස්ත්‍රාලයක් පිහිට වූ අතර රුජගේ බෑණනුවන් වූ අරශකේශරි විසින් සංස්කෘත රඝුවංශය මෙකල දෙමළ බසට නැඟීය.
- ආර්‍ය චක්‍රවර්ති නමින් හැඳින්වෙන පාලකයෝ 12 දෙනෙක් පිළිබඳව සඳහන් වේ. 1344 දී මෙහි පැමිණි ඉබ්න් බතූතා ආර්‍ය චක්‍රවර්ති හඳුන්වා ඇත්තේ ලංකාවේ සුල්තාන් ලෙසය.
- පණ්ඩ්‍ය බලයත් සමඟ ලක්දිව පාලකයන් දුර්වලවීම හා පණ්ඩ්‍ය හා ආර්‍ය චක්‍රවර්ති පාලක සබඳා මත 14 සියවස ආරම්භයේ සිට බලය අතින් ඔවුහු උච්චත්වයට පත්වීම.
- ක්‍රි. ව. 1344 වන විට මේ රාජ්‍යයේ සීමාවන් මන්නාරම දක්වා පැතිරීම.
- ක්‍රි. ව. 1347 පමණ සිට යාපනයේ ආර්‍ය චක්‍රවර්ති අවස්ථා දෙකක් දකුණට ආක්‍රමණ එල්ල කර බලය තහවුරු කරගෙන බදු ලබා ගත් බව තහවුරු කෙරේ.

- තෙවැනි වික්‍රමබාහු රජුගේ කාලයේ දී ගම්පොළ රාජධානියේ ඇතැම් ආධිපත්‍ය ගෙනයාමට ආර්ය චක්‍රවර්ති පාලකයන් සමත් වූ අතර මුළුල හා රාජාවලියේ තොරතුරුවලින් සනාථවීම.
- කෝට්ටේ සවැනි පරාක්‍රමබාහු දවස ආර්ය චක්‍රවර්ති පරාජය කළ සපු ව. 1450 සිට අවුරුදු 17 යාපනය පාලනය කිරීම.
- මේ අවස්ථාවේ ආර්ය චක්‍රවර්ති පාලකයා කණකසූරිය දකුණු ඉන්දියාව නැවත සේනාව සමඟ පැමිණ යාපනය අත්පත් කරගැනීම හා ප පරරාජසේකරම් බලයට පත්වීම.
- ක්‍රි. ව. 1519 පරරාජසේකරම් මරා දමා සංකිලි බලයට පත්වීම හා පසු පෘතුගීසීහු යාපනය අල්ලා ගැනීමට 1543, 1560 ආක්‍රමණය කිරීම.
- 1566 දී අභ්‍යන්තර අර්බුදයකින් පසු සංකිලිට රාජ්‍ය අහිමි වීම.
- පෙරියපුල්ලේ, පුවිරාජ පණ්ඩාරම්, පෘතුගීසීන් සමඟ කටයුතු කළ අතර ගිවිසුම් අත්සන් කළේය.
- සෙන්දරමානසිංහ පෘතුගීසීන්ට පක්ෂපාතිවීම හා පසුව පැමිණි II සංකිලි නොඉවසූ පෘතුගීසීහු 1619 පිලිප් ද ඔලිවේරා යටතේ හමුදාවක් යවා කර ගන්නා ලදී.

06. <u>පහත සඳහන් හේතු සම්බන්ධයෙන් ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ පළාත කරන ලද ප්‍රතිපත්තිය සාකච්ඡා කරන්න.</u> (ලකුණු 14 යි)

**පරිපාලන**

- ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් ශ්‍රී ලංකාවේ ල මෙහෙයවීම.
- ඔවුන්ගේ පාලනයට ලක් වූ ප්‍රදේශ - මුහුදු බඩ ප්‍රදේශවලින් සැලකිය බව දක්වීම.
- බතාවියේ පිහිටි පෙරදිග ලන්දේසි කටයුතු පිළිබඳ මූලස්ථානය ලන්දේසි පාලනයට උපදෙස් ලබාදුන් අතර ශ්‍රී ලංකාවේ පාල කොළඹවීම.
- ලන්දේසි ආණ්ඩුකාර පාලන සංවිධානයේ ප්‍රධානියාවීම හා ඔහු හිමිවීම සහ දේශපාලන සභාව පොලිටික්රාද් නමින් හැඳින්වීම

- පාලන ප්‍රදේශ - කොමාණ්ඩවරිවලට බෙදීම.
- දේශීය පාලන ක්‍රමය. ප්‍රාදේශීය බෙදීම් නිලතල ආදිය
- ඉහළ තනතුරුවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම.
- පරිපාලන සංවිධානය වාණිජමය ස්වරූපයක් ගැනීම.
- [illegible]

<u>අධිකරණය</u>

- වෙළඳ සමාගම වෙත නිකුත් කරන ලද ප්‍රඥප්තියෙන්ම ලන්දේසි බලයට යටත් ප්‍රදේශවල අධිකරණ කටයුතු සොයාම සමාගමට පැවරීම.
- ලන්දේසි පාලනය යටතේ කටයුතු කළ ස්වදේශික මුලාදෑනීන්ට අධිකරණ බලතල තිබීම.
- මඩුවන්ට ඉහළින් පිස්කල් දිසාවේ උසාවි පැවතීම.
- රාද්වරාත් ජස්ටිට් - කොළඹ. ගාල්ල. යාපනයේ පිහිටුවීම
- ලැන්ඩ්රාද් (ඉඩම් උසාවි)- කොළඹ. යාපනය. කල්පිටිය. ත්‍රිකුණාමලය. මඩකලපුව. ගාල්ල.
- බතාවියේ ශ්‍රේෂ්ඨාධිකරණය
- රෝම ලන්දේසි නීතිය ක්‍රියාවට නැගීම
- යාපන - හින්දු ජනතා පාරම්පරික නීතිය- තේසවලමේ නීතිය සංග්‍රහ කිරීම

<u>අධ්‍යාපන</u>

- පාසල් මඟින් අධ්‍යාපනය ලබාදීම - කතිසෝරුවන්
- අංක ගණිතය - ලතින් භාෂාව. භූගෝලය. වැනි විෂයන් ඉගැන්වූ බව.
- ස්කොලකල් කොමිෂම මඟින් පාසැල් පරිපාලනය අනිවාර්ය කිරීම.
- පාසැල් නොයිය අයට දඩ ගැසීම.
- පැරිස් පාසල ආරම්භ කිරීම. අනන්දරු පාසැල්
- ආගම ඉගැන්වීම අනිවාර්ය කළ බව
- පල්ලිය ආශ්‍රිතව පාසල් ආරම්භ කිරීම
- මුද්‍රණ යන්ත්‍රය හඳුන්වාදීම.

7. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේගෙන් බුද්ධ ශාසනයට සිදු වූ
පරීක්ෂා කරන්න. (ලකුණු 14

- 1698 තුන්පානේ වැලිවිට කුලතුංග පවුලටදාව උත්පත්තිය හා වයස අවුරු සූරියගොඩ විහාරයේ දී සූරියගොඩ මහාසාමි යටතේ පැවිදි වීම.
- ස්වෝත්සාහයෙන්ම පාලි සංස්කෘත හා ත්‍රිපිටක ධර්මය හැදෑරීම.
- සිල්වත් සමාගම පිහිටුවීම හා ප්‍රතිපත්ති පූරණය සඳහා අවකාශ සලසා දීම
- 1753 දී සියමෙන් උපසම්පදාව මෙරටට ගෙන්වා ගෙන උපසපන් භික්ෂු පරපු කිරීමට පියවර ගැනීම. සියම් නිකාය පිහිටුවීම, මල්වතු හා අස්ගිරි පාර්ශව ඇ සංඝරාජ තනතුරට පත්වීම, කතිකාවතක් සැකසීමට උපදෙස් ලබාදීම හ සංඝ සංවිධානයක් ගොඩනැගීම.
- ග්‍රන්ථ රචනා කිරීම, උදා:- රූපමාලාව, සාරාර්ථ සංග්‍රහය, හේසප්ප සන්නය, මුනිගුණාලංකාරය, සාරාර්ථදීපනි, මධුරාර්ථ ප්‍රකාශනී නිදසුන්ය.
- පිරිවෙන් අධ්‍යාපනය නැවත ආරම්භ කිරීම හා ගිහි පැවිදි සිසු පරපුරක් ගැනීම. ඒ අතරින් පහතරට ප්‍රදේශවල සිටි මෙතුමන්ගේ ශිෂ්‍යයන්ගේ ක්‍රියා (ඒ ඒ පළාත්වල)
- 19 වන සියවස ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයක් ඇතිවීමට හේතුවීම.
- පිරිවෙන් අධ්‍යාපනය නැවත ආරම්භ කිරීම හා ත්‍රිපිටක ධර්මය අධ්‍යයන ඒමඟින් අවකාශ සැලසීම
- පැරණි විහාරස්ථානයන් නවීකරණයට හා නව ස්ථාන දියුණු කිරීමට උපදෙ
- 1753 දී මහනුවර සතර දේවාල පෙරහැරට දළදා පෙරහැරද එක්කි උපදෙස් ලබාදීම.
- 

8. " 1817-1819 උඩරටියන් නැගිසිටීම, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහ විය," එම සටනට තුඩුදුන් සාධක මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.
(ලකුණු

- විදේශාධිපත්‍ය ඉවත් කොට දේශීය පාලකයෙක් යටතේ දේශීය පාලනය ගැනීම නිදහස් සටනක් ලෙසින් අර්ථ දැක්වීම.
- 1815 දී මුල් දිවයිනම ඉංග්‍රීසි ආධිපත්‍යය යටතට පත්වීමෙන් පසුව ඇ ඉංග්‍රීසි විරෝධී සටන වීම.

- 1815 ගිවිසුමට අනුව උඩරට පැවති රාජාණ්ඩුව අහෝසිකොට එහි ආධිපත්‍යය බ්‍රිතාන්‍ය රජු වෙත පැවරීම නිසා උඩරට ස්වාධීනත්වය අහෝසිවීම. (ඔබ රජකුමා නෙරපා දැමීය - එබෙන් අපට මීට වඩා යමක් අනවශ්‍යය. දැන් ඉවත්ව ගියාට කම් නැතැයි එක් නායකයෙකු පැවසීම.)
- 1817 - 1818 උඩරට ජනතා නැගී සිටීම.
- විදේශීය තර්ජන ඉදිරියේ මෙතෙක් කල් සිය ස්වාධීනත්වය රැක ගැනීමට උඩරටියන් සමත් වූ නමුත් එය අහිමිවීම කැරැල්ල ඇතිවීමට තුඩුදුන් ප්‍රධානතම සාධකයක් වීම.
- 1815 ගිවිසුමෙන් උඩරට පාලන ක්‍රමය උඩරට ප්‍රධානීන්ගේ බලතල හා වරප්‍රසාද ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දුන් නමුත් බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඒ සියල්ල පමණක් නොව සමාජ තත්ත්වය ද ක්‍රමයෙන් හීනවීම නිසා උඩරට ප්‍රභූන් තුළ බ්‍රිතාන්‍යයන් කෙරෙහි ඇති වූ විශාල කළකිරීම කැරැල්ලට හේතුවීම. ඒ නිසා බ්‍රිතාන්‍යය පාලනය අවසන් කොට රාජාණ්ඩුව ඇති කිරීමට ඔවුන් කල්පනා කිරීම.
- උඩරට ගිවිසුමෙන් බුද්ධාගම, දේවාගම හා ආගමික දේපල ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දුන් නමුත් බ්‍රිතාන්‍ය පාලනය යටතේ පෙර රජවරුන්ගෙන් ලැබූ සැලකිල්ල හා අනුග්‍රහය නොලැබෙන බව පෙනීයාම නිසා භික්ෂූන් වහන්සේලා තුළ ඇති වූ කලකිරීම කැරැල්ලට එක් හේතුවක් වීම. මේ නිසා බෞද්ධ රජෙකු පත් කිරීමට භික්ෂූන් වහන්සේලාට තිබූ බලාපොරොත්තුව.
- තමන්ට නොපෙනෙන රජෙකුට පක්ෂපාතීත්වය දැක්වීම නොහැකි වූ වැසියන්ට රදළ ප්‍රධානීන්ට හා භික්ෂූන් වහන්සේලාටත්, ස්වකීය සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ටත් මෙන්ම ආගමටත් නිසි ගෞරවයක් නොදක්වන ඉංග්‍රීසීන් කෙරෙහි කලකිරීමක් ඇතිවීමත් ඒ නිසා ඔවුන් ද රජෙකෙනෙක් මෙන්ම කලින් පැවති රාජාණ්ඩු පාලනය යළි ඇති කිරීමට බලාපොරොත්තු වීම.
- දළදා වහන්සේ හා රාජත්වය අතර තිබූ කිට්ටු සම්බන්ධය හා කැරලි නායකයන් දළදාව අත්පත් කර ගැනීම මෙන්ම දළදා ප්‍රදර්ශන පැවැත්වීම.
- සටන පැවැති අවස්ථාවේදී රාජාණ්ඩුවක් පිහිටුවීමට උත්සාහ කිරීමත් රජු ලෙස පෙනිසිටි පුද්ගලයා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඥාතියෙකු වූ දොරේසාමි ලෙස පෙනී සිටීමින් ඔහු විරවික්‍රම ශ්‍රී කීර්ති යන නමින් අභිෂේක ලැබීම.
- මේ කරුණු සියල්ලෙන්ම 1817 - 18 සටන බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලයක් ලෙස අර්ථ ගැන්විය හැකිය. එහෙත් මෙම සටන උඩරට ප්‍රදේශවලට සීමාවීම, උඩරට



Scanned with CamScanner

පළාත්වල ඇතැම් ප්‍රබල ප්‍රධානීන් හා ඔවුන් යටතේ පැවති පාලන ප්‍රදේශ සහයෝ නොදැක්වීම යන කරුණු නිසා පූර්ණ නිදහස් සටනක් නොවන බවට ද තර්ක කිරී අවකාශයක් ඇත.

9. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

I පොළොන්නරු ගෘහ නිර්මාණ

- අනුරාධපුර යුගයට වඩා ගෘහ නිර්මාණකරණය සංකීර්ණ ස්වරූපයක් ගැනීම.
- ශිල්පීන් බොහෝ දුරට පැරණි සම්ප්‍රදායන් අනුගමනය කිරීම.
- ගඩොල් භාවිතය බහුල වීම.
- මෙකල රජවරුන්ගේ කාලයේ ඉදි කළ ගෘහනිර්මානවල ලක්ෂණ පෙන්වාදීම.
- දකුණු ඉන්දියානු හින්දු කෝවිල්වල ඇති ගෘහනිර්මාන සම්ප්‍රදායන්වල බලපෑම.
- ගොඩනැගිලි සැළසුම් අනුරාධපුර යුගයට වඩා වෙනස් ස්වරූපයක් ගැනීම.

II පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණය

- මුළු ශ්‍රී ලංකාවේම දේශපාලන හා වෙළඳ ආධිපත්‍ය තහවුරු කර ගැනීමේ අවශ්‍ය
- ආගම ප්‍රචලිත කිරීම.
- පළමුවන විමලධර්ම සූරිය රජතුමා 1592 දී බලයට පත්වීම නිසා හටගත් හංගත්වය හා සෘජුවම උඩරට බලය අපේක්ෂාවෙන් එල්ල කළ ආක්‍රමණ.

ආක්‍රමණික අවස්ථා හා සටන්

- දන්තුරේ - 1594 - පේරෝ ලෝපේස් ද සූසා - I විමලධර්මසූරිය රජතුමා කුසු දේවිය (දෝන කතිරිනා) ලබා ගැනීම.
- 1602 - 1604 බලන සටන - දොන් ජෙරනිමෝද අසවේදු.
- 1630 - රන්දෙනිවල සටන - කොන්ස්තන්තිනූද සා.
- 1638 - ගන්නෝරු සටන - දියෝගෝද මෙලෝ කුස්තෝ.

සාර්ථක අසාර්ථක බව

- සියලු ප්‍රයත්නයන් අසාර්ථක වීම
- ලස්කිරිඤ්ඤ හමුදා (පහතරට සිංහල හමුදා) උඩරට හමුදාවට එක් උඩරට රජතුමාට දක්වන ලද සහයෝගය.

- උඩරටියන්ගේ රාජපාක්ෂික භාවය හා පහත රටියන්ගේ කැරලි උඩරටියන්ගේ සටන් ක්‍රම හා උඩරට ස්වාභාවික රකවරණය පෘතුගීසීන්ට අභියෝගයක් වීම.

## III බ්‍රිතාන්‍යයන් යටතේ රාජකාරි ක්‍රමය

- ශ්‍රී ලංකාවේ පැරණි අවධියේ සිට සමාජ ආර්ථික කටයුතු සංවිධානය වී තිබූ ආකාරය 'රාජකාරි ක්‍රමය' ලෙස හැඳින්වේ. රාජකාරි ක්‍රමයේ ඉඩම් භුක්තිය රාජකාරිය සහ අනිවාර්ය සේවා රාජකාරිය යනුවෙන් කොටස් දෙකකි.
- රජුට කරනු ලබන සේවා වෙනුවෙන් වේතන වශයෙන් ඉඩම් ලබාදීම සිරිත විය. එය ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය ලෙස හැඳින්වේ.
- වැඩිහිටි පිරිමින් සියලු දෙනා විසින් වසරකට නිශ්චිත දින ගණනක් රජයට නොමිලේ සේවය සැපයීම අනිවාර්ය රාජකාරිය නම් වේ.
- සිංහල රජවරුන් යටතේ මෙන්ම මුහුදු බඩ ප්‍රදේශවල පෘතුගීසීන් සහ ලන්දේසීන් යටතේ ද මෙම ක්‍රමය ක්‍රියාත්මක කෙරිනි.
- පළමුවැනි ඉංග්‍රීසි ආණ්ඩුකාර ෆෙඩ්රික් නෝත් මෙම ක්‍රමය ඔවුන්ගේ මතිමතාන්තරවලට නොගැළපෙන ක්‍රමයක් වූ බැවින් අවලංගු කිරීමට කටයුතු කිරීම.
- එහෙත් මෙම දේශීය ක්‍රමයට දේශීය ජනතාව හුරු පුරුදුව සිටි බැවින් එය අවලංගු කිරීම නුසුදුසු බව සිතූ මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා අනිවාර්ය රාජකාරි ක්‍රමය නැවත ආරම්භ කළේය. එහෙත් ඔහු ඉඩම් බුක්ති රාජකාරි ක්‍රමය අවලංගු කිරීම අනුමත කළ බැවින් එය යළි ප්‍රතිෂ්ඨාපනය කළේ නැත.
- 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ද අවලංගු කෙරිනි. එමඟින් ඉතිහාසයේ සමාරම්භක අවධියේ සිට මෙරට සමාජ රටාව හැඩගැන් වූ රාජකාරි ක්‍රමය අභාවයට පත්වීම.

## IV 1910 1931 දක්වා ව්‍යවස්ථාදායක සභාවේ පැවැති නියෝජන ක්‍රමය

- ආණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් නියෝජිතයන් පත්කිරීම 1833 ව්‍යවස්ථාදායක මණ්ඩලය හඳුන්වා දුන් අවස්ථාවේම ක්‍රියාත්මක කළ ක්‍රමය වීම.
- එම නියෝජිතයන් ජනවර්ග අනුව නම් කිරීම නිසා ජනවාර්ගික නියෝජන ක්‍රමය ද ආරම්භ වීම.

- 1889 දී ව්‍යවස්ථාදායක සභාවට පත්කරන ලද නියෝජිතයන් සංඛ්‍යාව දෙදෙ ගෙන් වැඩි කළ අතර ඒ දෙදෙනා ද ජනවර්ග අනුව උඩරට සිංහල හා මුස් යනුවෙන් නම් කරනු ලැබීම.
- 1910 දී සීමිත ඡන්ද බලය හඳුන්වා දෙනු ලැබීය. උගත් ශ්‍රී ලාංකේයන් වෙනුවෙන් ද මන්ත්‍රීවරයෙක් නියමිත උගත්කම හා වත් පොහොසත්කම් ඇති අයගේ ඡන්දයෙ තෝරා ගැනීමට ඉඩ ලැබුණි. ජනවාර්ගික නියෝජන ක්‍රමය ද පවත්වාගෙන ය ලැබීම.
- 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ සීමිත ඡන්ද බලය යටතේ පළාත් ද ඡන්ද කොට්ඨාශ කිහිපයකින් ද ව්‍යවස්ථාදායක සභාවට මන්ත්‍රීවරුන් තෝරා ගැනීම අවස්ථාව ලැබුණි. ජනවාර්ගික නියෝජනය ද එලෙසින්ම පවත්වාගෙන යනු ලැබීම.
- 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ යටතේ ද ඡන්ද බලය සීමාවිය. එහෙ පළාත් බද නියෝජන ක්‍රමය පුළුල් කෙරිනි. එමඟින් ව්‍යවස්ථාදායක සභාවේ බහුතර ඡන්ද බලයෙන් තෝරාගනු ලැබූ නියෝජිතයෝ වූහ. ජනවාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබීම.
- 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පළාත් බද ඡන්ද කොට්ඨාශ ක්‍රමය ද සර්වජන ඡන්ද බලය ද ලබාදීම සහ ජනවාර්ගික නියෝජන ක්‍රමය අවලංගු කිරීම.

**10 ඉදිරිපත් කොට ඇති ඓතිහාසික කරුණු මත ලකුණු ලබාදීම කළ යුතු වේ.**